හද රිදවන මතක සුවඳ සහ අන්ධ භක්තිය - 7

රෝහණ සහෝදරයා ට එරෙහිව නඩුව විභාගයට ගත් දිනවල නුවරඑළියේ අධිකරණය වෙත ගමන් කරද්දී අප ගිමන් නිවා ගත්තේ බොහෝ විට දේශාභිමානී ගීත ගායනා කිරීමෙන් බව මීට පෙර ලියූ ලිපියෙන් පැහැදිලි කලෙමි. එසේ දේශාභිමානී ගීත ගායනා කරන ලද අවස්ථා වලදී ඇතැම් ජාති'ප්‍රේමී' ගීත දේශාභිමානී ගීත බවට හරවා ගත් ආකාරයත්, 1971 අප්‍රේල් නැගී සිටීමෙන් පසු කාලයේ දී සටන් බිම් වල සහ බන්ධනාගාර තුල 'විමුක්ති ගී' විකාශණය වූ ආකාරයත් මෙම ලිපියෙන් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වෙමි.

අපේ රටේ බොහෝ දෙනෙක් අතර, විශේෂයෙන් ප්‍රගතිශීලී ජන කොටස් අතර විශාරද ඩබ්ලිව්. ඩී. අමරදේව සහ විශාරද නන්ද මාලනී වැනි කලා ශූරීන්ගේ ගීත ඉතා ජනප්‍රිය බවට පත් වී තිබිනි. ඒ කාලයේ 'ව්‍යාපාරය' ලෙස හැඳින්වුනු ජනතා විමුක්ති පෙරමුණේ සහෝදර සහෝදරියන් අතර ද මෙය පොදු ලක්ෂණයක් විය. අනෙක් ගීත වලට සහ ගායක ගායිකාවන්ට ඔව්හු ආශාවක් නොදැක්වූවාම නොවේ. උදහරණයක් ලෙස අමරදේවයන් ගායනා කල 'පෙර දිනයක මා පෙම් කල යුවතිය' නමැති ගීතය 1980 වේ මුල එක් කාලයක දී රෝහණ සහෝදරයාගේ ප්‍රියතම ගීතය බවට පත් වී තිබුනේය. එහෙත් අමරදේවයන්ගේ 'රත්න දීප ජන්ම භූමි' සහ නන්ද මාලනීයගේ 'මේ සිංහල අපගෙ රටයි' වැනි ගීත රෝහණ සහෝදරයා ඇතුළු අප සියළු දෙනාගේ හදවත් අරක් ගෙන තිබුනේ යයි කිවහොත් එය නිවැරදි යයි සිතමි. එසේ වුවද මෙම ගීත ගායනා කිරීමේ දී ඒවායේ ඇතැම් පද රචන අපේ අදහස් සමග පරස්පර වන බවක් පෙනී ගියේය.



ජනතා විමුක්ති පෙරමුණටම ආවේණික වූ එවැනි ගීත ශෛලියක්, රටාවක් බිහි වෙන්නට පටන් ගත්තේ 1971 බියකරු ධවල භීෂණය හේතුවෙන් තම ජීවිතාරක්ෂාව සඳහා වනාන්තරවලට පසුබැස සටන් කරමින් සිටි සගයින්ගේත් බන්ධනාගාර සහ සිර කඳවුරු තුල රඳවා තබා ගෙන සිටි සගයින්ගේත් ගී නිර්මාණයන් තුලිනි. දුකෙන් කම්පා වී හඬා වැටෙන හදවත් තුල මතු වුන කඳුළු බිඳු වලින්, කටුක වේදනාවන්ගෙන් හෙම්බත් වූ පීඩිතයන්ගේ ගතින් වෑහුන දහඩිය බිඳු වලින්, වධ වේදනාවට ලක් වී ගලා ගිය ලෝහිත දහරා වලින් ගී වැල් ලියැවෙන්නට පටන් ගැනුනේ මෙතැන් සිට යයි කිවහොත් එය නිවැරදි යයි මම කල්පනා කරමි. සටනින් තොරව ජයක් ලබා ගත නොහැකි බව වටහා ගත් විප්ලවවාදීහු මෙසේ ලියූ රණ ගීත උස් හඬින් ගායනා කරන්නට පටන් ගත්හ.

ජනතා විමුක්ති පෙරමුණටම ආවේණික වූ එවැනි ගීත ශෛලියක්, රටාවක් බිහි වෙන්නට පටන් ගත්තේ 1971 බියකරු ධවල භීෂණය හේතුවෙන් තම ජීවිතාරක්ෂාව සඳහා වනාන්තරවලට පසුබැස සටන් කරමින් සිටි සගයින්ගේත් බන්ධනාගාර සහ සිර කඳවුරු තුල රඳවා තබා ගෙන සිටි සගයින්ගේත් ගී නිර්මාණයන් තුලිනි. දුකෙන් කම්පා වී හඬා වැටෙන හදවත් තුල මතු වුන කඳුළු බිඳු වලින්, කටුක වේදනාවන්ගෙන් හෙම්බත් වූ පීඩිතයන්ගේ ගතින් වෑහුන දහඩිය බිඳු වලින්, වධ වේදනාවට ලක් වී ගලා ගිය ලෝහිත දහරා වලින් ගී වැල් ලියැවෙන්නට පටන් ගැනුනේ මෙතැන් සිට යයි කිවහොත් එය නිවැරදි යයි මම කල්පනා කරමි. සටනින් තොරව ජයක් ලබා ගත නොහැකි බව වටහා ගත් විප්ලවවාදීහු මෙසේ ලියූ රණ ගීත උස් හඬින් ගායනා කරන්නට පටන් ගත්හ.

ප්‍රසංගයක් වශයෙන් මුලින් ම 'විමුක්ති ගී' උපත ලද්දේ තබ්ලාව වෙනුවට බෙලෙක් තැටියත්, ජෝගුවත්, මියුරු සංගීතය වෙනුවට ගොරෝසු කට හඬත් එක් කොට සිර කූටි තුල පැවැත් වූ සමරු ගී වැඩ සටහන් තුලිනි.

1977 නොවැම්බර් මස දෙවැනි ද බන්ධනාගාර ජීවිතයෙන් නිදහස ලබා ගෙන යලිත් විවෘත දේශපාලනයට පිවිසුන පසු මුල්ම 'විමුක්ති ගී' ප්‍රසංගය සංවිධානය කොට ඉදිරිපත් කරන ලද්දේ මැද කොළඹ නව නගර ශාලාවේ දී ය. එම මුල් 'විමුක්ති ගී' ප්‍රසංග යේ සිට 1983 දී තහනමට ලක් වන තෙක් පැවැත්වූ සියළුම ප්‍රසංග සංවිධානය කරන ලද්දේ සාමූහික ප්‍රයත්නයන් වශයෙනි. මේ සම්බන්ධයෙන් පැවැත්වූ මුල් සාකච්ඡා, පුහුණු වීම් සහ ප්‍රසංග වටයට මා සමග නන්දන මාරසිංහ, (පොඩි) ජයතිලක සහ ඒ කාලයේ මැද කොළඹ ඩිස්ත්‍රික් ලේකම්ව සිටි විමල් යන සහෝදරවරුන් ද, සුනිලා අබේසේකර සහෝදරිය ද ඇතුළු කිහිප දෙනෙක් සහභාගි වූහ. 1983 ජූලි මාසයේ දී එක්සත් ජාතික පක්ෂයේ රජය විසින් ජනතා විමුක්ති පෙරමුණ තහනම් කරනු ලබන්නට පෙර 'විමුක්ති ගී' ප්‍රසංගය පැවැත්වීම තහනම් කොට තිබුනි. මෙයට පෙර වතාවක දී ද (මගේ මතකයට අනුව 1981 දී) 'විමුක්ති ගී' ප්‍රසංගය තහනමට ලක් කරන ලදී.

ඒ අවස්ථාවේ දී එකල පොලිස්පතිවරයාව සිටි ආනා සෙනෙවිරත්න මහතා හමු වී 'විමුක්ති ගී' ප්‍රසංගය තහනම් කිරීමට එරෙහිව මම ඔහුට කරුණු ඉදිරිපත් කෙලෙමි. 'විමුක්ති ගී' කැසට් පටියක් ඔහු අතට දී එහි තහනම් කිරීමට තරම් වන යමක් තිබේ නම් මට එය පෙන්වා දෙන ලෙස ද ඔහු ගෙන් ඉල්ලා සිටියෙමි. 'විමුක්ති ගී' ප්‍රසංගය ට පනවා තිබුනු තහනම ඉන් සති දෙකකට පමණ පසු ඉවත් කර ගන්නා ලදී. දෙවැනි වතාවට 'විමුක්ති ගී' තහනම් කරන අවස්ථාව වන විට යාපනය, මඩකලපුව ද ඇතුළුව දිවයින පුරා පවත්වා තිබුනු 'විමුක්ති ගී' ප්‍රසංග සංඛ්‍යාව දෙසියය ඉක්මවා යමින් තිබිනි.

එහෙත් මෙම මුළු කාලය පුරාම එක්තරා විමුක්ති ගීයක් ගැන මා නොදැන සිටි කරුණක් විය. වර්තමාන ජනතා විමුක්ති පෙරමුණට සම්බන්ධයක් නොමැතිව, 2008 වසරේ කොළඹ දී 1971 ජනතා විමුක්ති පෙරමුණට සම්බන්ධව සිටි සාමාජික පිරිසක් විසින් පවත්වන ලද අප්‍රේල් වීරු සැමරුම් උත්සවයකට සහභාගි වීමට මට අවස්ථාව ලැබිනි. 'විමුක්තියේ රතු උදර - කුසුමන් පරසතු මදර' නමැති ගීතයේ පද රචනය කරන ලද්දේ 1971 අරගලයේ දී පසුබැස වනාන්තර ගත වී සටන් කල සගයන්ගෙන් කෙනෙකු වූ, පේරාදෙනිය විශ්ව විද්‍යාලයේ අප සමග සිටි කෑගල්ලේ උදේනි බන්දුල සහෝදරයා විසින් බව මට දැන ගන්නට ලැබුනේ එම අවස්ථාවේ දී ය. එම ගීයේ පද රචකයා 1971 අරගලයේ දී කෑගල්ල සහ කුරුණෑගල ඩිස්ත්‍රික්කවලින් පසුබැස වනාන්තර ගත වී සටන් කරමින් සිටි සගයෙකු බවත්, ඔහු කවුරුන් දැයි කිසිවෙක් හරියටම නොදන්නා බවත් පවසමින් මෙම කරුණ ඒ තාක් කල් මගෙන් වසන් කොට තිබිණි.

පක්ෂ ඉතිහාසය පුරා නොයෙක් අවස්ථාවලදී පක්ෂයේ ඉදිරි ගමණට යම් යම් පුද්ගලයින් අත දුන් ආකාරය මුළුමණින් අමතක කොට දමා ඔවුන්ගේ වැරැදි පමණක් හුවා දක්වමින් ඔවුන් පිළිබඳ කරුණු විකෘති කර පෙන්වමින් එම පුද්ගලයන් සතුරන් බවට පත් කර ගැනීමට ජනතා විමුක්ති පෙරමුණ තුල ප්‍රවණතාවයක් ඇත. ජනතා විමුක්ති පෙරමුණේ නායකත්වය විසින් බොහෝ අය සම්බන්ධයෙන් මෙවැනි විකෘති කිරීම් රාශියක් ඉදිරිපත් කොට තිබේ. රෝහිත මුණසිංහ සහෝදරයා පල කොට තිබෙන 'හද රිදවන මතක සුවඳ' නමැති ප්‍රකාශණයෙහි දක්වා තිබෙන ඇතැම් වැරදි සහගත කරුණු වලට පදනම් වී තිබෙන්නේ ද මෙවැනි විකෘති කිරීම් සමහරක් බව පෙනේ.

'විමුක්ති ගී' ප්‍රසංගයේ ඉදිරි ගමන ගැන තවත් කරුණු ස්වල්පයක් ඊළඟ ලිපියෙන් ...

ලයනල් බෝපගේ